# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම
## 2018 ජුලි මස 03 වන දින පෙ.ව. 9.30 ට
## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන
II. නොපැමිණසිටීමේ අවසරය පිළිබඳ යෝජනා
III. ලිපිලේඛන පිළිගැන්වීම
IV. කාරක සභා වාර්තා පිළිගැන්වීම.
V. පෙත්සම්
VI. ප්‍රශ්න / අතුරු ප්‍රශ්න

1. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු මාර්ග ප්‍රවාහන සමූපකාර සංවර්ධන හා වෙළඳ නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2018.06.19 වන දින අසන ලද ප්‍රශ්නය, (ප්‍ර/VI/(1)/18/23)

(අ) බස්නාහිර පළාත තුළ ගම්පහ, කොළඹ, කළුතර, යන දිස්ත්‍රික්ක තුනෙහි පවත්නා මගී බස්රථ බලපත්‍ර වලට අමතරව 2018 වර්ෂය සඳහා අලුතෙන් නිකුත් කර ඇති මගී ප්‍රවාහන මාර්ග බලපත් ගණන දිස්ත්‍රික්ක සඳහා වෙන් වෙන් වශයෙන් කොපමණද?

(ආ) ඒ කුමන මාර්ග අංකයන් සඳහන් පාරවල් සඳහාද?

(ඇ) එකී නව මාර්ග බලපත් නිකුත් කිරීමෙන් බස්නාහිර පළාත් සභා මාර්ගයන්හි ධාවනයේ දී නිතර ආරවුල් උද්ගතවන තත්ත්වයක් පවතින බව ඔබතුමා දන්නේද?

(ඈ) මෙම නව බලපත් නිකුත් කර ඇති තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් මොනවාද?

(ඉ) මෙම මාර්ග බලපත් නිකුත් කර ඇත්තේ මාර්ග සඳහා බස් අතිරික්තයක් පවතින අවස්ථාවක බව ඔබ දන්නේද?

(ඊ) මාර්ග ධාවනයේ දී ඇතිව තිබෙන මෙම ආරවුල් සහගත තත්ත්වයන් වලක්වා ගැනීමට ඔබතුමාට හැකිද?

(උ) නොඑසේ නම් ඒ මන්ද?

2. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2018.06.19 වන දින අසන ලද ප්‍රශ්නය, (ප්‍ර/VI/(1)/18/25)

(අ) මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපයේ දිවුලපිටිය ඥානෝදය මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති තනතුර පුරප්පාඩු වී කොපමණ කාලයක් ගතවී ඇත්ද? යන්න සභාවට දන්වන්නෙහිද?

(ආ) අදාල විදුහලේ විදුහල්පතිවරයෙකු නොමැති වීම නිසා එහි පරිපාලනය අවුල් සහගත වී ඇති බව ඔබතුමා දන්නෙහිද?

(ඇ) හිටපු විදුහල්පතිනියට ස්ථාන මාරුවීම් ලබා දී මාස කිහිපයක් ගත වුනද, එකී විදුහලට නීත්‍යානුකූලව විදුහල්පතිවරයෙකු පත් නොකිරීමට හේතු සභාවට දන්වන්නෙහිද?

(ඈ) එම විදුහලට විදුහල්පතිවරයෙකු පත්කිරීම සම්බන්ධයෙන් ඔබතුමා ක්‍රියාමාර්ගයක් ගන්නේද?

(ඉ) නොඑසේ නම් ඒ මන්ද?

3. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2018.06.19 වන දින අසන ලද ප්‍රශ්නය, (ඉ/VI/(1)/18/26)

(අ) මෙල්කෝ ඔක්ෂිජන් සමාගම පවත්වා ගෙන යන වත්තල මාබෝල නගර සභාව සතු ඉඩම අවුරුදු 30 කට එම සමාගමට බදු දී ඇති බවත්, මේ වන විට අවුරුදු 15 ක් ගෙවී ඇති බවත් ඔබතුමා පිළිගන්නෙහිද?

(ආ) එම ඉඩම මේ වන විට වත්තල මාබෝල නගර සභාව විසින් අදාළ සමාගම වෙත විකිණීමට කටයුතු කර ගෙන යන බව ඔබතුමා දන්නෙහිද?

(ඇ) ප්‍රදේශයේ පර්චස් 01 ක් රුපියල් ලක්ෂ 45 ත් 50 ත් අතර ප්‍රමාණයකට විකිණෙන නමුත් අදාල ඉඩම ඉතා අඩු මිලකට මෙල්කෝ සමාගමට විකිණීමට කටයුතු කරන බව ඔබතුමා දන්නෙහිද?

(ඈ) පර්චස් 161 හිමි එකී ඉඩම එසේ විකිණීමට එරෙහිව ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ගය සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම් ඒ මන්ද?

4. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග ප්‍රවාහන සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2018.06.19 වන දින අසන ලද ප්‍රශ්නය, (ඉ/VI/(1)/18/27)

(අ) වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාබෝල සිට එඬේරමුල්ල දක්වා දිවෙන (වැලිකඩමුල්ල පාර) මාර්ගයේ අධිවේගී මාර්ගයේ ගුවන් පාලම අසල කොටස කඩා ඉවත් කරන්නේ කුමක් සඳහා ද යන්න ඔබතුමා සභාවට දන්වන්නෙහිද?

(ආ) එසේ එම කොටස කඩා ඉවත් කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට අවසර දුන්නේ කවුරුන්ද යන්නත්, කුමක් පදනම් කර ගෙනද යන්නත් ඔබතුමා සභාවට දන්වන්නෙහිද?

(ඇ) එසේ එම කොටස කඩා ඉවත් කිරීම මත සුළු ගංවතුරකදී පවා ප්‍රදේශය ජලයෙන් යටවීමට ඉඩ ඇති බව ඔබතුමා පිළිගන්නෙහිද?

(ඈ) එසේ එම කොටස කඩා ඉවත් කිරීම සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන්ගේ විරෝධතාවයක් තිබෙන බැවින් මෙම ගැටළුව විසඳීම සඳහා ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද? යන්න සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම් ඒ මන්ද?

5. ගරු නිරෝෂා අතුකෝරළ මන්ත්‍රීතුමිය විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,

(ඉ/VI/(1)/18/31)

(අ) 2017 වසරේ මීගමුව අධ්‍යාපන කලාපයේ අ.පො.ස (සා/පෙළ) විභාගය සඳහා පෙනී සිටි ළමුන් සංඛ්‍යාව කොපමණද?

(ආ) එයින් පළාත් පාසල්වල ළමුන් සංඛ්‍යාව කොපමණද?

(ඇ) 2017 වසරේ මීගමුව අධ්‍යාපන කලාපයේ අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් සමත් හා අසමත් ළමුන් සංඛ්‍යාව කොපමණද?

(ඈ) 2016 ට සාපේක්ෂව 2017 වසරේ සමත් අසමත් ළමුන් සංඛ්‍යාව කොපමණද?

(ඉ) 2017 වසරේ මීගමුව අධ්‍යාපන කලාපයේ අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් ගණිත විෂය සමත් අසමත් ළමුන් සංඛ්‍යාව කොපමණද?

(ඊ) 2016 වසරට වඩා මෙම වසරේ ගණිත විෂය සමත් අසමත් ළමුන් සංඛ්‍යාව කොපමණද?

6. ගරු එම්.එස්.එම්. ෆයිරූස් මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු, සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,

(ඉ/VI/(1)/18/32)

(අ) රාමසාන් උපවාස මාසයේ මුස්ලිම් දේවස්ථානවලට රටඉඳි බෙදාදීමක් ඔබ අමාත්‍යාංශය මැදිහත්වීමෙන් ඉටු කරන්නේද?

(ආ) එම ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබුවේ කවදාද ?

(ඇ) රටඉඳි බෙදීම සඳහා වාර්ෂිකව වෙන් වූ මුදල් ප්‍රමාණයන් හා බෙදූ රටඉඳි ප්‍රමාණයන් වෙන්-වෙන්ව කොපමණද?

(ඈ) ඒ ඒ වර්ෂයන්හිදී රටඉඳි බෙදා දුන් දේවස්ථාන හා ඒවාට ලබා දුන් රටඉඳි ප්‍රමාණයන් වෙන් වෙන්ව කොපමණද?

(ඉ) රටඉඳි බෙදීමේ දී මුස්ලිම් දේවස්ථාන තෝරා ගැනීම සිදු කරනු ලබන ක්‍රමවේදය කුමක්ද?

(ඊ) එම ව්‍යාපෘතිය සඳහා රටඉඳි මිලදී ගනු ලබන ක්‍රමවේදය හා ඒ ඒ වර්ෂයන් හිදි මිලදී ගනු ලැබූ ආයතන කවරේද?

(ඍ) අදාල රටඉඳි නියමිත ලෙස අදාල දේවස්ථානවලට ලැබුණු බවට වන පසු විපරම් සහතිකය කුමක්ද?

7. ගරු අශෝක සපුමල් රන්වල මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; (ඉ/VI/(1)/18/33)

(අ) බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් 2015 වර්ෂයේ සිට මේ දක්වා කොපමණ සේවක පිරිසක් බඳවාගෙන තිබේද?යන්න ඔබතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම බඳවා ගැනීමේ දී අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටිය කුමක්ද?යන්නත්, නියමිත සුදුසුකම් සපුරා ඇති අය බඳවා ගත්තේද,යන්නත් ඔබතුමා සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2015 සිට එම සේවකයින් හට නිවාඩු දීමනාව ලබා දුන්නේ ද යන්නත්, ලබා නොදුන්නේ නම් ඒ කුමන කරුණක් මතද යන්න ඔබතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) එම සේවකයින් සඳහා සේවක අර්ථ සාධක හා භාරකාර අරමුදල්වල මුදල් තැන්පත් කරන ලද්දේ ද යන්නත්, එසේ නොකළේ නම් කුමන කරුණක් මුල්කරගෙන ද යන්නත්, තැන්පත් කළේ නම් මේ වන විට කොපමණ මුදලක් තැන්පත් කර ඇද්ද යන්නත් ඔබතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම් ඒ මන්ද?

8. ගරු අශෝක සපුමල් රන්වල මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; (ඉ/VI/(1)/18/34)

(අ) බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ කොළඹ 01 කාර්යාලයේ පරිපාලන නිළධාරි ධාවන බී.එන්.එස්. කරුණාචන්ද්‍ර මහතා එම තනතුරෙහි බඳවා ගැනීමේ දී ඔහුට වඩා සුදුසුකම් සපුරා ඇති අය සිටියදී ඔහුට ප්‍රමුඛත්වය ලබා දුන්නේ කුමන පදනමකින් ද යන්න මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම තනතුරට සුදුසුකම්ලත් අය විසින් මානව හිමිකම් කොමිසන් සභාවේ පැමිණිල්ලක් කර ඇති අතර, එම වාර්තාවට අනුව කටයුතු නොකළේ ඇයි ද?යන්න මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඔහුගේ ක්‍රියාකලාපය හේතුවෙන් එම ආයතනයේ සේවකයින් විසින් 2015.12.05 වන දින ප්‍රාදේශීය කලමනාකරුට පැමිණිල්ලක් කර ඇති බවත්, එකී පැමිණිල්ලට සාධාරණය ඉටු නොකලේ ඇයි ද?යන්න ඔබතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එසේ එම තනතුරට නුසුදුසු එකී නිළධාරිවරයාගේ ක්‍රියාකලාපය සම්බන්දයෙන් ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද? යන්නත්, සුදුසුකම් සපුරා ඇති අයට සාධාරණය ඉටු කර දීමට ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද? යන්නත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම් ඒ මන්ද?

VII. පෞද්ගලික ප්‍රකාශ

VIII. වරප්‍රසාද කඩවීම් පිළිබඳ ප්‍රකාශ

IX. අමාත්‍යාංශ නිවේදන / අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ / වරප්‍රසාද කඩවීම් පිළිබඳ පිළිතුරු

X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

01. <u>ගුරු නිරෝෂා අතුකෝරළ මන්ත්‍රීතුමිය :</u>

"වසර 30 ක් පමණ කාලයක් ශ්‍රී ලංකාව තුළ පැවති බෙදුම්වාදී ත්‍රස්තවාදය හේතුවෙන් ලක්ෂයකට ආසන්න මිනිස් ජීවිත අහිමි වූ අතර, ඉතා විශාල ආර්ථික හා සමාජ පරිහානියක් සිදුවිය. එකී බෙදුම්වාදී ත්‍රස්තවාදය හේතුවෙන් ශ්‍රී ලංකා රාජ්‍යයට සමෘධිමත් රටක් ලෙස සංවර්ධනයේ ප්‍රතිලාභ අත්පත් කර ගැනීමට තිබූ අවස්ථාවන් අහිමි වූ අතර, විදෙස් රාජ්‍යයන්හි බලපෑමට පවා ලක්වීමට සිදු විය. එකී දුර්දාන්ත කාලවකවානුව අවසන් කරමින් ලක්වැසි සියළු දේශප්‍රේමී ජනතාවගේ සහයෝගය ඇතිව බෙදුම්වාදී ත්‍රස්තවාදය පරාජය කිරීමට ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවට හා පොලිසියට හැකි විය. මෙම යුධ ගැටුම් හේතුවෙන් මියගිය අය හා සදාකාලික ආබාධිත තත්ත්වයට පත් වූ අපගේ රණවිරුවන් මෙන්ම, නිරායුධ හා අහිංසක සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව සිහිපත් කරනු වස්, එකී සන්නද්ධ ත්‍රස්තවාදය සහමුලින්ම පරාජයට පත් කළ මැයි මස 18 වන දින, "ජාතික සංහිඳියාවේ විරු සැමරුම් දිනය" ලෙස නම් කළ යුතු යැයි ද, කිසිදු ජන කොටසක් අගතියට පත් නොවන ආකාරයට එම සැමරුම අභිමානවත්ව සිදු කළ යුතු යැයි ද මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව, රජය වෙත යෝජනා කර සිටියි."

(යෝ/vi(1)/18/03)

02. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා ;

"බ්ලූමැන්ඩල් කුණු කන්ද, මීතොටමුල්ල කුණු කන්ද, කරදියාන කුණු කන්ද, වැනි කුණු කඳු කඩා වැටී මනුෂ්‍ය ජීවිතත්, සමස්ත පරිසරයත් ව්‍යසනයට පත් වෙද්දී ඒවාට වග කියන බලධාරීන්, ආයතන ,ඒවා වැළැක්වීමටත් ,ඒවාට ස්ථිර සාර විසඳුම් යොදන බවත්, කියමින් නොයෙකුත් පුරසාරම් දොඩන ලදී. මීතොටමුල්ල කුණු කන්දත්; බ්ලූ මැන්ඩල් කුණු කන්දත් නාගරික උද්‍යාන බවට පත් කරන බවට ප්‍රකාශ කරන ලදී. තවමත් එම කුණු කඳු එසේම පවතී. දීර්ඝ කාලීන වැඩපිළිවෙලක් නොමැත. කැළණි ගඟ වසරක් පාසා පිටාර ගලද්දී ඒවාට යට වන ජනතාවට එම අවස්ථාවේ දී බත් පැකට්ටුවක්, වියළි ආහාර ටිකක් බෙදා දී තාවකාලිකව සමනය කරනු ඇත. මෙම සියළු ව්‍යසනයන්ට ඒ ඒ විෂයන් අයත් අමාත්‍යාංශ මැදිහත්ව ,දීර්ඝකාලීන විසඳුම් ඉදිරිපත් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ සභාව යෝජනා කර සිටියි."

(යෝ/vi(1)/18/04)

## XI. සභාව කල් තැබීම.

2018.06.20 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

කේ.එච්.ඕ.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.